2018 නොවැම්බර් මස 20 වැනිදා අඟහරුවාදා

ලංකාදීප

# පවතින දේශපාලන අර්බුදය ජනතාව හමුවට ගොස් විසඳාගමු

## හිටපු ඇමැති මිලින්ද මොරගොඩ කියයි

ජනතාව හමුවට ගොස් පවතින දේශපාලන අර්බුදය විසඳාගත යුතු යැයි හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කළේය.

එමෙන්ම මහා මැතිවරණයක් පැවැත්වීම සඳහා භාරකාර ආණ්ඩුවක් පිහිටුවීම සුදුසු බවත් එය මහා මැතිවරණය පැවැත්වීම අරමුණු කරගත් තාවකාලික එකක් විය යුතු බවත් ඔහු සඳහන් කළේය.



ඔහු මේ බව සඳහන් කළේ ඇතිව තිබෙන දේශපාලන අර්බුදය සම්බන්ධයෙන් මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

**ඔහු මෙසේද කීවේය.**

සෑම දේශපාලන පක්ෂයකටම නියෝජනය ලබා දිය හැකියි. රාජ්‍ය සම්පත් භාවිතා නොකරන, අනිසි බලය උපයෝගී කරගත නොහැකි ස්වාධීන මහා මැතිවරණයකට එයින් මග පාදාගත හැකි වෙනවා.

පක්ෂ එකඟතාව ඇත්නම් සම්පූර්ණයෙන්ම දේශපාලනයෙන් තොර, පුළුල් උපදේශක මණ්ඩලයක් පත්කරගත හැකි අතර අගමැති ධුරය වෙනුවට ප්‍රධාන උපදේශක ධුරයක් ඇති කර එමගින් මහ මැතිවරණය මෙහෙයවිය හැකියි.

අර්බුදය විසඳාගැනීමට එවැනි ක්‍රියාමාර්ග අනුගමනය කරන ලද අවස්ථා ජාත්‍යන්තරයෙහි තිබෙනවා.

පසුගිය දින ගණනාව තුළ පාර්ලිමේන්තු රැස්වීම් විශාල ගාලගෝට්ටියක් වුණා. එය පුරවැසියන්ට පමණක් නොව ජාත්‍යන්තර ප්‍රජාවටද අප්‍රසන්න අවස්ථාවක් බව සඳහන් කළ යුතුය. ශ්‍රී ලංකාව යම් අර්බුදයක් උචිත ලෙස විසඳාගත හැකි රටක් බව මෙරට දේශපාලනයෙන් ඔප්පු කළ යුතු බවද හෙතෙම අවධාරණය කරයි.

එක්සත් ජාතික පෙරමුණු රජයේ පමණක් නොව එක්සත් ජනතා නිදහස් පක්ෂ ආණ්ඩුවේද ප්‍රධාන අමාත්‍ය තනතුරු දැරූ මිලින්ද මොරගොඩ මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන පරිදි මෙවැනි අර්බුදකාරී වාතාවරණයක් හමුවේ සියලු දෙනාට පිළිගත හැකි අලුත් ව්‍යුහයකින් විසඳුමක් කළ යුතු යැයිද හෙතෙම කීවේය.